ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

මහජන කටයුතු අංශය
ටෙලි 94 (1) 249-8100 • ෆැක්ස් 94 (1) 244-9070
ඊමේල් : VanHornNT@state.gov ● http://lk.usembassy.gov

නිවේදන අංක:20180425

## 2018 පැසිෆික් සහයෝගිතාව සඳහා ඇමෙරිකා එක්සත් ජනපද නාවික හමුදාවේ ජංගම රෝහල් නෞකාව මර්සි(Mercy) ත්‍රිකුණාමලයට පැමිණෙයි

2018 අප්‍රේල් 25, කොළඹ : 2018 පැසිෆික් සහයෝගිතා මෙහෙවර පැවැත්වීම සඳහා අප්‍රේල් මස 25 වන දින ඇමෙරිකා එක්සත් ජනපද නාවික හමුදා රෝහල් නෞකාව (USNS Mercy) ත්‍රිකුණාමලය බලා සේන්දු විය.

පැසිපික් සහයෝගිතා 2018 වැඩ සටහන මැයි මස 08 වන දා දක්වා පැවැත්වෙන අතර එක්සත් ජනපද සහ වෙනත් හමුදා වෛද්‍යවරුන් හා වෛද්‍ය වෘත්තිකයන් දේශිය ප්‍රජාවන් වෙත ප්‍රතිකාරලබා දිම සහ ඔවුන් සමග ප්‍රශස්ත වෛද්‍යමය පිළිවෙත් හුවමාරු කර ගැනිම සඳහා ශ්‍රී ලාංකික වෛද්‍ය වෘත්තිකයන් සමග උරෙනුර ගැටෙමින් කටයුතු කිරිම මෙහිදි දැකගත හැකිය. එයට අමතරව, එක්සත් ජනපද සහ හවුල්කාර රටවල ජාතික සේවා සාමාජිකයන් දේශීය ප්‍රජාව තුළ පවතින සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති, මානුෂීය සහාය සැපයීම් සහ ආපදා සහන සුදානම් පුහුණු (HA/DR) සහ මහජනතාව වෙත ගොස් සේවාවන් ලබාදිම වැනි කටයුතු සඳහා ශ්‍රී ලාංකික සම සහකරුවන් සමග එක්ව් කටයුතු කරනු ඇත.

ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා එක්සත් ජනපද තානාපති අතුල් කෙශප් විසින් ප්‍රකාශ කරන ලද්දේ “අවශ්‍යතාවයෙන් පෙලෙන ශ්‍රී ලාංකිකයන් හට සේවය කිරිම සඳහා සහ අපගේ වැඩි දියුණු වන හවුල්කාරිත්වය තවදුරටත් පුළුල් කර ගැනිමසඳහා 2018 පැසිෆික් හවුල්කාරිත්ව වැඩසටහන තුලින් එක්සත් ජනපද හා ශ්‍රී ලංකා හමුදාවන්ට තවත් අනගි අවස්ථාවක් උදා කර දෙයි“ යනුවෙනි. අපගේ නාවිකයන් විසින් වෛද්‍ය සායනවල සිට නොමිලේ පැවැත්වෙන මහනජන විනෝද සංදර්ශන දක්වා ඇමෙරිකාවෙන් ලැබෙන ප්‍රශස්ත හා ඉතාම මහඟු සේවාවන් රැසක් දේශීය ප්‍රජාවන් වෙත ගෙන එයි.

USNS Mercy නෞකාව අංග සම්පූර්ණ ශල්‍ය මෙහෙයුම් කාමර 12 ක්,ඇඳන් 1000 කින් සමන්විත රෝහල් පහසුකම්, ඩිජිටල් විකිරණ සේවා, වෛද්‍ය රසායනාගාරයක්, ඔසුසලක්, අක්ෂි අංශය පිලිබඳ රසායනාගාරයක් (optometry) CAT ස්කෑන් යන්ත්‍රයක් සහ ඔක්සිජන් නිෂ්පාදන යන්ත්‍ර දෙකකින් සමන්විත වේ. සුවිසල් හමුදා හෙලිකොප්ටර් ගොඩබැස්සවිම සඳහා ඉඩකඩ පවතින හෙලිකොප්ටර් යාත්‍රාංගනයකින් මෙම නැව සමන්විත වේ.

2018 මෙහෙවර තුළ මෙම නෞකාව බෙංග්කුලු, ඉන්දුනිසියා සහ මැලේෂියාවේ ක්වාලාලම්පූර් යන ස්ථානවල නවාතැන් ගෙන මෙහෙවර ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවෙන් පිටත් වීමෙන් අනතුරුව USNS නෞකාව, ඉන්දු-පැසිෆික් කලාපය තුල හවුල්කාරිත්වයන්, මිත්‍ර සබඳතා, සහ බහුපාර්ශ්වික

හවුල්කාරිත්වය සවිමත් කරමින් වියට්නාමය හා ජපානය වෙත සේන්දු වී මෙහෙවර සැලසීමේ නිරත වීමට නියමිතය.

2018 පැසිෆික් සහයෝගිතාවය සඳහා වන මෙහෙවර (මෙහෙයුම්) අණ දෙන නිලධාරී කපිතාන් ඩේවිඩ් බ්‍රේටිස් මෙසේ පැවසිය. “අපගේ කණ්ඩායම ශ්‍රී  ලංකාවේ ජනතාව සමග උරෙනුර ගැටෙමින් කටයුතු කරනු දැකීමෙන් මම ඉතාම මවිතයට පත්වෙමි. පැසිෆික් සහයෝගිතාවය පුරාවට ශ්‍රී ලංකාව ජනතාව සමග අප  විශ්වාසය මිතුදම සහිත බැඳීම් හා හවුල්කාරිත්වයන් ගොඩ නගා ගන්නා අතර ඒ මගින් ස්වාභාවික හා කෘතිම ආපදා සමගින් අපගේ ජාතින් මුහුණ දෙනු ලබන බහුවිධ වූ අසම්භාවිතාවයන් වලට ඔරොත්තු දීමට අප  තුළ සූදානමක් ගොඩ නගා ගැනීමේ සහාය සැලසේ.  මෙම රටෙහි අමුත්තන් බවට පත්වීමටත් අපගේ ශ්‍රී ලාංකික හුවල්කරුවන් සමග එකට එක්ව කටයුතු කිරීමටත් ලැබීම අපට ගෞරවයක් සේ සලකමු.“

පැසිෆික්  සහයෝගිතාවය යනු ඉන්දු පැසිෆික් කලාපය තුළ පවත්වනු ලබන විශාලතම  වාර්ෂික බහුපාර්ශ්වික ආපදා ප්‍රතිචාර හා පෙර සූදානම් මෙහෙවර (මෙහෙයුම) වේ.  මෙම වසරේ මෙහෙයුම සඳහා එක්සත් ජනපදය,  කැනඩාව,  එක්සත් රාජධානිය, ඔස්ට්‍රේලියාව, ප්‍රංශය, පේරු රාජ්‍යය සහ ජපානය යන රටවල හමුදාව සහ සිවිල් ජනතාව ඇතුළත් වේ. ඉදිරියේදී ඇතිවීමේ විභවතාවයක් පවතින මානුෂීය ආධාර සැපයීම් සහ ආපදා සඳහා ප්‍රතිචාර සැලසීමේ තත්ත්වයන්ට වඩා හොඳින් සූදානම් වීමේ හැකියාව නිර්මාණය කරමින් සත්කාරක රාජ්‍යයන්ගේ සහකරුවන් සමග උරෙනුර ගැටෙමින් කටයුතු කරන එක්සත් ජනපද සහ හවුල්කාර රාජ්‍යයන්ගේ හමුදාවන් සහ සිවිල් වැසියන් 800 දෙනෙකුට වඩා වැඩි ප්‍රමාණයකින් මෙම පැසිෆික් සහයෝගිතාවය 2018 සමන්විත වේ.